# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1805/38 - 2013 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2013.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15(1) වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති කළුතර නගර සභාවට අයත් ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 26 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර නගර සභා සීමාව තුළ දේසාස්ත්‍ර කළුතර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ජයසිරි කොඩිකාරගේ විසින් මැන පිළියෙල කරන ලද අංක 2535 හා 1998.03.15 දිනැති සැලැස්මේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.14164 (අක්. 00, රූ. 01, පර්. 16) විශාල වූ කැලිඩෝ තානායම් භූමිය ඉඩමේ මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුර | : | මුහුදු වෙරළ පාරේ, වරිපනම් අංක 102 දරන තුඩුවේවත්ත කැබලි අංක 1ඒ ඉඩම ; |
| නැගෙනහිර | : | මුහුදු වෙරළ පාර ; |
| දකුණ | : | මුහුදු වෙරළ පාර ; |
| බටහිර | : | මුහුදු වෙරළ පාර. |

04 - 857

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
1A - G 17554 — 340 (2013/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*